දුරකථන/தொலைபேசி/Telephones :
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — 2484728
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் நாயகம் / Addl. Director General — 2484729
පොදු / பொது / General — 2484731
ෆැක්ස් / பெக்ஸ் / Fax — (941) 2473856, (941) 2320042

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහ භාණ්ඩාගාරය
அரச கணக்குகள் திணைக்களம்
பொதுத் திறைசேரி
**Department of State Accounts**
**General Treasury**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date — 2004-05-11
පළමුවන මහල, තැ. පෙ. අංකය 1559,
මහලේකම් කාර්යාලය, කොළඹ 01 – ශ්‍රී ලංකාව
முதலாம் மாடி., செயலகம், த.பெ. இல. 1559,
கொழும்பு 01, ஸ்ரீ லங்கா.
1st Floor, The Secretariat,
P.O.Box 1559, Colombo 01 – Sri Lanka.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : 171/2004

අමාත්‍යාංශ ලේකම් වරුන්,
පලාත් සභා ප්‍රධාන ලේකම් වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය (GPS-4) නිකුත් කිරීම

රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල වැටුප් සැකසීම සඳහා රාජ්‍ය ගණකාධිකාරිවරුන්ට නොමිළයේ නිකුත්කරන GPS මෘදුකාංගයේ අලුත්ම සංස්කරණය වන GPS 4 දැන් නිකුත් වී ඇත. මෙය ලබා ගැනිමට අදහස් කරන ගණකාධිකාරවරුන් මේ සමඟ ඇති ආකෘති පත්‍රය පුරවා අත්සන් කර ඩිස්කට් එකක්ද සමඟ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට හෝ රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනයට ඉදිරිපත් කළ යුතුයි. මෙය භාවිතා කිරීමට අවශ්‍ය පුහුණුව රාජ්‍ය මූල්‍ය හා ගිණුම් ආයතනයෙන් මුදල් ගෙවා ලබාගත හැකි අතර භාවිතයේදි මතුවිය හැකි ගැටලු පිළිබඳව පහත සඳහන් දුරකථන අංක වලින් උපදෙස් ලබාගත හැකිය.

(1) රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය - දුරකථන අංක : 2472335 / 2472336
මර්ල් පොන්වීර මහතා ( ශ්‍රී ලං.ග.සේ ) - ලේඛකාධිකාරි/ ගණකාධිකාරි

(2) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - දුරකථන අංක : 2484826 / 2484881
කපිල අල්විස් මහතා (ශ්‍රී ලං.ග.සේ)-සහකාර අධ්‍යක්ෂ

මෙම මෘදුකාංගය වැය ශීර්ෂ ගත රාජ්‍ය ගිණුම් ක්‍රම පිළිබඳ දැනුමැති ගණකාධිකාරි වරයෙකුගේ පාලනය යටතේ පමණක් භාවිතා කිරීමට සැලසුම් කර ඇති හෙයින් එබඳු පාලනයකින් තොරව කටයුතු කිරීමෙන් සිදුවිය හැකි දෝෂ සහ වංචා වැලැක්වීම පිණිස මෙම මෘදුකාංගය ගණකාධිකාරිවරයෙකුගේ පෞද්ගලික ඉල්ලීම මත පමණක් නිකුත් කරන බව කරුණාවෙන් සැලකුව මැනවි.

එන්. වරුසවිතාරණ
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

## රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් අනුගමනය කළ යුතු පාලන ක්‍රම.

වැටුප් සකස් කිරීමේ හා ගෙවීමේ සාමාන්‍ය පාලන රෙගුලාසි හා උපක්‍රම වලට අමතරව පහත සඳහන් පාලන උපක්‍රමද භාවිතා කළ යුතුය.

1. අවසරලත් අයට පමණක් පනගැන්විය හැකිසේ වැටුප් සකස් කරන පරිගණක අවසර පද යොදා අවහිර කර තැබිය යුතුය (POWER ON PASSWORD) මීට අමතරව GPS - 4 හී අන්තර්ගත පළමුවන අවසර පදය ගණකාධිකාරී හෝ ඔහුගේ බලයලත් වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු හෝ වෙත පමණක් රදවා ගත යුතුඅතර එය අන්කිසිවෙකුට දැන ගැනිමට ඉඩ නොතැබිය යුතුය. දෙවන සහ තුන්වන අවසර පද පිළිවෙලින් ප්‍රධාන ලිපිකරුට හා වැටුප් ලිපිකරුට ලබාදිය යුතු අතර එම අවසර පදද වෙනත් අයට දැනගැනිමට ඉඩ නොතැබීම ඔවුන්ගේ වගකීම බව අවබෝධ කරදිය යුතුයි.

2. තුන් මසකට වරක්වත් අවසර පද වෙනස් කළ යුතුය.

3. වැටුප් ලිපිකරු විසින් නිලධාරින්ගේ මාසික වැටුප්වල වෙනස් වීම ඇතුලත්කල පසු වැටුප් වැඩසටහන පෙරසැර් කිරීම (Payroll Process)ගණකාධිකාරීවරයා විසින් සිදුකළ යුතුයි.

4. වැටුප් වැඩසටහන පෙරසැර්කල අවස්ථාවෙදිම වැටුප් ගිණුම් සාරාංශය(Account Summary) ගණකාධිකාරීවරයා විසින් මුද්‍රණය කර ළඟ තබා ගත යුතු අතර වැටුප් චෙක්පත් අත්සන් කිරීමේදී එම සාරාංශයේ තිබෙන සංඛ්‍යා සමඟ එකඟවන්නේදැයි පරික්ෂාකල යුතුයි. එකතුව නිසිපරිදි සසඳා බැලිය යුතුය.

5. පසුගිය මාසයට වඩා මේ මාසයේ එක් එක් වැටුප හා වැය ලෙජරයට භර කරන ප්‍රමාණ වෙනස් වුයේ කුමන හේතුවක් නිසාදැයි ගණකාධිකාරීවරයා විසින් සොයා බලා සෑහීමකට පත්විය යුතුය.

6. වැටුප් සකස් කිරීම භාරව සිටින නිලධාරියා බැංකුවට මුදල් ගෙන ඒමට මුදල් පැකට් කිරීමට, බැංකු සැසදුම් පිළියෙල කිරීමට හෝ වැටුප් මුදල් ගෙවීමට යොදා නොගත යුතුය.

7. ගණකාධිකාරීවරුන් නොමැති ප්‍රාදේශීය සභා හා නගර සභා සඳහා GPS වැඩසටහන ලබාදීමේදී පලාත් සභාව යටතේ ඇති පලාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ගණකාධිකාරීවරයාගේ හෝ පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් (මුදල්) වරයාගේ ඉල්ලීම මත පමණක් සිදුකරනු ලබන අතර එසේ ලබාගත් පසු එම ආයතනවල වැටුප් ගෙවීම සම්බන්ධ අභ්‍යන්තර පාලන කටයුතු පිළිබඳව අධීක්ෂණ ඔවුන් විසින් කළ යුතුවේ.

8. Payslip එකේ සටහන් වී ඇති ඉලක්කම් පිළිබඳව සැලකිලිමත් වන ලෙස ආයතනයේ නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුවේ.

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ,

## GPS- 4 **මෘදුකාංගය ඉල්ලා සිටීම**

වැටුප් ගෙවන ආයතනයේ නම (ඉංග්‍රීසි බසින්) :-

ලිපිනය :-

වැය ශීර්ෂ අංකය :-

ආයතනයේ ගණකාධිකාරීගේ නම :-

දුරකථන අංකය :-

මෙම ආයතනයේ වැටුප් ගෙවීම රජයේ ගණකාධිකාරවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකරණ බවටද පසුපිටෙහි සඳහන් උපදෙස් තරයේ පිළිපදින බවටද GPS පාඨමාලාව හදාරන ලද එක් නිලධාරියෙකු වත් මෙම කාර්යාලයේ සේවයේ යොදවන බවටද සහතික කරමි.

GPS - 4 ඉල්ලා සිටින ගණකාධිකාරීගේ නම :

දිනය:- අත්සන :

---

නිකුත් කළ දිනය : යොමුව: